**04-12-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ දැන් පරම පියාගෙන් දිව්‍යමය දෘෂ්ටිය ලබා ඇත. දිව්‍යමය දෘෂ්ටියෙන් පමණයි ඔබට ජීවාත්ම සහ උත්තරීතර පරමාත්ම ජීවය පෙනෙන්නේ.

**ප්‍රශ්නය:** නාටකයේ කිනම් රහස දැන ගැනීමෙන්ද ඔබ, යම්කිසි අවවාදයක් කිසිම කෙනෙකුට නොදෙන්නේ?

**පිළිතුර:** අතීතයේ නාටකයේ සිදු වූ සෑම දෙයක්ම, ඒ අයුරින්ම නිවැරදිව නැවත සිදුවන බව ඔබට වැටහෙන විට, ඔබ කිසිම කෙනෙකුට භක්තිය අත්හරින්න යැයි අවවාද කරන්නේ නැත. මෙම ඥානය ඔවුන්ගේ බුද්ධියේ හොඳින් තැන්පත් වූ විට, ඔවුන් ජීවාත්ම බවත්, අසීමිත පියාගෙන් ඔවුන්ගේ උරුමය හිමි කරගත යුතු බවත් වටහාගත් විට, සහ ඔවුන් ඔහුව හඳුනාගත් විට, ඔවුන්ගේ සීමිත සෑම දෙයක්ම ඉබේටම අවසන් වේවි.

ඕම් ශාන්ති. ඔබ මෙතැන අසුන්ගෙන සිටින්නේ ඔබගේ ආදී ධර්මයේ ස්ථාවර වීද? ආධ්‍යාත්මික පියා ඔය ආධ්‍යාත්මික දරුවන්ගෙන් අසන්නේ, ආත්මය යැයි කියන්නේ අසීමිත පියාට පමණක් බව ඔබ දන්නා නිසයි. ඔහුට කියන්නේ උත්තරීතර කියායි. ඔහුට කියන්නේ උත්තරීතර ආත්මය නැතහොත් උත්තරීතර පරමාත්ම ජීවය කියායි. උත්තරීතර පරමාත්ම ජීවය, පරමාත්ම දෙවියන්, අනිවාර්යෙන්ම සිටියි ඔහු පවතින්නේ නැතැයි කිව නොහැක. උත්තරීතර පරමාත්ම ජීවය නම් පරමාත්ම දෙවියන්ය. මෙය ඔබට විස්තර කර දී ඇත. එබැවින් ඔබ අවුලට පත් නොවිය යුතුයි. මන්ද, ඔබ වසර 5000 කට පෙර ද මෙම ඥානයට සවන් දුන්හ. මෙයට සවන් දෙන්නේ ජීවාත්මයයි. ජීවාත්ම ඉතාමත් කුඩායි, සූක්ෂමයි. ඒවා ඒ තරම් කුඩා බැවින් මෙම ඇස් වලින් නොපෙනෙයි. මෙම ඇස් වලින් ජීවාත්මයක් දැක ඇති කිසිම මනුෂ්‍යයෙක් නොමැත. ඒවා දැකිය හැක, එහෙත් දිව්‍යමය දෘෂ්ටියෙන් පමණයි, එය වුවද නාටකයේ සැලැස්මට අනුවයි. අච්චා, නිදසුනක් වශයෙන්, කෙනෙකුට අනිත් දේවල් දකින ආකාරයටම ජීවාත්මයක දෘෂ්ටියක් ඇතිවෙයි. භක්ති මාර්ගයේද, ඔවුන්ට යම්කිසි දෙයක දෘෂ්ටියක් ඇති වූ විට, එය සිදුවන්නේ ඔවුන්ගේ භෞතික ඇස් දෙකිනි. ඔවුන්ට එම දිව්‍යමය දෘෂ්ටිය ලැබී, එය ජීවමාන ස්වරූපයෙන් මෙන් ඔවුන් දකී. ජීවාත්මයකට ඥානයේ තුන්වෙනි ඇස ලැබී, ඒ තුළින් යම් දෙයක් දකී, එහෙත් එය ධ්‍යානයකට සම වැදුණු අවස්ථාවකදීය. භක්ති මාර්ගයේදී, ඔවුන්ට දෘෂ්ටිය ලැබෙන්නේ, ඔවුන් බොහෝ සෙයින් භක්තියේ යෙදුනේනම්ය. නිදසුනක් වශයෙන්, ඇය දිව්‍ය ලෝකයේ නටන දෘෂ්ටියක් මීරාට ඇති විය. කෙසේවෙතත්, දිව්‍ය ලෝකය එවිට පැවතුණේ නැත. එය වසර 500 කට 600 කට පෙර වන්නට ඇති. දිව්‍ය ලෝකය එම කාලයේදී සැබෑවටම පැවතුණේ නැත. අතීතයේ පැවතුණු ඕනෑම දෙයක් පෙනෙන්නේ දිව්‍යමය දෘෂ්ටියෙන්ය. ඔවුන් බොහෝ සෙයින් භක්තියේ යෙදී, සම්පූර්ණයෙන්ම භක්තියේ ගිලී සිටින විට ඔවුන්ට දෘෂ්ටියක් ඇති වෙයි. කෙසේවෙතත්, ඔවුන්ට එයින් විමුක්තිය ලැබෙන්නේ නැත. විමුක්තියේ සහ ජීවන් මුක්තියේ මාර්ගය, භක්ති මාර්ගයෙන් සම්පූර්ණයෙන්ම වෙනස්ය. භාරතයේ දේවාල බොහෝමයක් තිබේ. ඔවුන් ශිවාගේ පිළිමයක් ද ඒවායේ තබයි. ඔවුන්ට විශාල පිළිම මෙන්ම කුඩා පිළිම ද තිබේ. ජීවාත්මයන්, උත්තරීතර පරමාත්ම ජීවය වාගේ බව ඔය දරුවන්ට වැටහෙයි. සෑම ජීවාත්මයකගේම ප්‍රමාණය එක වගේයි. පරම පියා කෙසේද, දරුවන් ද ඒ වගේමයි. ජීවාත්මයන් සිල්ලන්ම සහෝදරයන්ය. ජීවාත්මයන් තම ශරීර තුළට ඇතුළු වන්නේ, තම චරිත කොටස් රඟ පෑමටයි. මෙය වටහා ගත යුතු දෙයකි. මේවා භක්ති මාර්ගයේ ඇති ගොතපු කතා නොවෙයි. ඥාන මාර්ගයේ දේවල් විස්තර කර දෙන්නේ එක් පරමාත්ම පියා පමණයි. පළමුවෙන්ම, සෑම දෙයක්ම විස්තර කර දෙන්නේ අසීමිත අශාරීරික පියා පමණයි. කිසිවෙකුට ඔහුව සම්පූර්ණයෙන්ම සහ නිවැරදිව තේරුම් ගත නොහැක. ඔවුන් කියන්නේ ඔහු සර්ව ව්‍යාපිතිකයි කියාය. එය නිවැරදි නැත. ඔවුන් බොහෝ සෙනෙහසින් යුතුව පියාට අඬ ගසයි. ඔවුන් කියන්නේ බාබා, ඔබ පැමිණි විට අපි ඔබට භාර වන්නෙමු. අන් කිසිවෙකු නොව, ඔබම පමණක් මගෙයි. එබැවින්, ඔබ අනිවාර්යෙන්ම ඔහුව සිහිපත් කළ යුතුයි. ඔහුම පවසන්නේ ඔහෝ දරුවනි! ඔහු කතා කරන්නේ ජීවාත්මයන්ටයි. මෙයට කියන්නේ ආධ්‍යාත්මික ඥානය කියායි. ජීවාත්මයන්, උත්තරීතර පරමාත්ම ජීවයෙන් බොහෝ කාලයක් වෙන්ව සිටි බව සිහිපත් කෙරෙයි. මෙම ගිණුම ද පෙන්වා දී තිබේ. ඔය ජීවාත්මයන් බොහෝ කාලයක් පුරා ඔහුගෙන් වෙන්වී ජීවත් වී ඇති අතර, නැවත වරක් රාජ යෝගා ඉගෙන ගැනීමට ඔබ පරම පියා වෙතට පැමිණ ඇත්තේ දැනුයි. ගුරුවරයා ඔබගේ සේවකයායි. ගුරුවරයෙක් සෑම විටෙකම කීකරු සේවකයෙකි. පරම පියාද පවසන්නේ මම සියලුම දරුවන්ගේ සේවකයායි. ඔබ අඬගසන්නේ එය ඔබගේ

අයිතියක් ලෙසටයි ඔහෝ පාරිශුද්ධකරුවාණෙනි, පැමිණ අපව පාරිශුද්ධත්වයට පමුණුවන්න! ඔබ සියලු දෙනා භක්තිකයන්ය. ඔබ කියන්නේ අහෝ දෙවියනි, එන්න! ඇවිත් නැවත වරක් අපව පාරිශුද්ධත්වයට පත් කරන්න! පාරිශුද්ධ ලොවට දිව්‍ය ලෝකය යැයිද අපවිත්‍ර ලොවට නරකාදිය යැයිද කියයි. මේ සෑම කරුණක්ම වටහා ගත යුතුයි. මෙය කොලීජියක් සහ දෙවි පියාණන්ගේ විශ්ව විද්‍යාලයයි. එහි ඉලක්කය සහ අරමුණ, මනුෂ්‍යයින් දේවතාවන් බවට පරිවර්ථනය කිරීමයි. ඔබට වීමට අවශ්‍ය වන්නේ මෙයයි යන විශ්වාසය ඔය දරුවන්ට තිබේ. විශ්වාසය නොමැති කෙනෙක් පාසැලේ අසුන් ගනීද? ඉලක්කය සහ අරමුණ ඔබගේ බුද්ධියේ ඇත. ඔබ බැරිස්ටර් කෙනෙක් හෝ වෛද්‍යවරයෙක් වීමට යන්නේ නම්, ඔබට ඉගෙන ගැනීමට සිදුවෙයි. ඔබට මෙම විශ්වාසය නොතිබුණේ නම් ඔබ මෙහි පැමිණෙන්නේ වත් නැත. ඔබ සාමාන්‍ය මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට, සාමාන්‍ය මිනිසෙකුගෙන් නාරායන් බවට පරිවර්ථනය වනවා යන විශ්වාසය ඔබට තිබේ. සාමාන්‍ය මිනිසෙකුගෙන් නාරායන් බවට පරිවර්ථනය වීමේ සත්‍ය කතා පුවත මෙයයි. ඇත්ත වශයෙන්ම මෙය ඉගෙනුමකි, එහෙත් එයට කතා පුවතක් යැයි කියන්නේ ඇයි? ඔබ එය වසර 5000 කට පෙරත් ඇසූ නිසයි. එය දැන් අතීතයයි. අතීතයට කතාවක් (ධර්ම කතාවක්) යැයි කියයි. සාමාන්‍ය මිනිසෙකුගෙන් නාරායන් බවට පරිවර්ථනය වීම සඳහා පාඩම් මේවාය. ඔය දරුවන්ගේ හදවතින් ඔබ දන්නවා දේවතාවන් සිටින්නේ නව ලෝකයේ බවත්, මනුෂ්‍යයින් සිටින්නේ පැරණි ලෝකයේ බවත්. දේවතාවන්ට තිබෙන ගුණධර්ම මනුෂ්‍යයින්ට නොමැත, ඒ නිසයි ඔවුන්ට දේවතාවන් යැයි කියන්නේ. මනුෂ්‍යයින් දේවතා පිළිරූ අභියස හිස නමා මෙසේ කියයි ඔබ සෑම ගුණධර්මයකින්ම පරිපූර්ණයි... ඉන්පසු ඔවුන් තමන් පහත් පව්කාරයින් ලෙස හඳුන්වයි. මෙසේ කියන්නේ මනුෂ්‍යයින්ය. මෙසේ කියන්නේ දේවතාවන් නොවෙයි. දේවතාවන් වෙසෙන්නේ ස්වර්ණමය යුගයේය ඔවුන්ට කලි යුගයේ විසිය නොහැක. කෙසේවෙතත්, මෙකළ, ඔවුන් සෑම කෙනෙකුටම ශ්‍රී, ශ්‍රී යැයි කියයි. ශ්‍රී හි තේරුම ශ්‍රේෂ්ඨයි. ඔබව වඩාත්ම ශ්‍රේෂ්ඨ අය බවට පත් කළ හැක්කේ පරමාත්ම දෙවියන්ට පමණයි. ශ්‍රේෂ්ඨ දේවතාවන් සිටින්නේ ස්වර්ණමය යුගයේය. මෙකළ කිසිම මනුෂ්‍යයෙක් ශ්‍රේෂ්ඨ නැත. ඔය දරුවන්ට දැන් අසීමිත අත්හැරීම තිබේ. මෙම පැරණි ලෝකය විනාශ වීමට ඉතාම ආසන්න බව ඔබ දන්නා නිසයි එය පිළිබඳව ඔබට නිරාශාවක් ඇත්තේ. එම මිනිසුන් හත යෝගා අත්හරින්නන්ය. ඔවුන් තම නිවෙස් අතහැර පිටවී යයි. ඉන්පසු ඔවුන් ගොස් මාලිගාවල ජීවත් වෙති. ඔවුන්ගේ කුඩා කුටි ආදියෙහි ජීවත් වීමේදී කිසිම වියදමක් දැරීමට නැත කිසිත් නැත. හුදෙකලාව සඳහා කෙනෙක් අසුන් ගත යුත්තේ කුඩා කුටියකයි, මාලිගාවක නොවෙයි. බාබාද කුඩා කුටියක් සාදවා ගෙන තිබේ. කුඩා කුටියක සෑම සතුටක්ම තිබේ. ඔය දරුවන් දැන් උත්සාහ කළ යුත්තේ, මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය වීමටයි. නාටකයේ සිදු වූ සියල්ලක්ම අතීතය බවත්, එය නැවතත් ඒ අයුරින්ම නිවැරදිව සිදුවන බවත් ඔබ දනී. මේ නිසයි ඔබ කිසි කෙනෙකුට භක්තිය නවත්වන්න යැයි අවවාද නොකළ යුත්තේ. මෙම ඥානය ඔවුන්ගේ බුද්ධීන් තුළ තැන්පත් වූ විට තමන් ජීවාත්ම බවත් අසීමිත පියාගෙන් තම උරුමය හිමි කර ගත යුතු බවත් ඔවුන්ට වැටහෙයි. අසීමිත පියා හඳුනාගත් විට සීමිත සෑම දෙයක්ම අවසන් වෙයි. පරමාත්ම පියා පවසන්නේ තම පවුලත් සමඟ නිවසෙහි ජීවත් වන අතරතුර, නිකම්ම තම බුද්ධියේ යෝගාව පරම පියාට සම්බන්ධ කරන්න. භක්ති මාර්ගයේ සමහර මිනිසුන් දැඩි භක්තියේ බොහෝ සේ යෙදෙන අයුරින්ම, ශරීරයේ ජීවිකාව වෙනුවෙන් ක්‍රියාවන් සිදු කළ යුතුයි. ඔවුන්ගේ ඉතා දැඩි විනයක් වශයෙන් ඔවුන් දිනපතාම පිළිරූ බැලීමට යයි. ශාරීරික ජීවීන් වෙතට යෑම භෞතික වන්දනා ගමනකි. භක්ති මාර්ගයේදී ඔවුන්ට බොහෝ සේ ඉබාගාතේ යෑමට සිදුවෙයි. මෙහි ඔබ කිසි සේත්ම ඉබාගාතේ නොයයි. මිනිසුන් මෙහි පැමිණි විට ඔවුන්ට මෙම ඥානය විස්තර කර දීම සඳහා ඔවුන්ට ඉඳගැනීමට සලස්වයි. කෙසේවෙතත්, පරමාත්ම පියා සිහිපත් කිරීම සඳහා ඔබ එක් ස්ථානයක අසුන් ගත යුතුයි කියා දෙයක් නැත. භක්ති මාර්ගයේ, ක්‍රිෂ්ණාගේ භක්තිකයන්ට ඇවිදින අතරතුරදී සහ එහෙ මෙහෙ සැරිසරද්දී ඔහුව සිහිපත් කළ නොහැකිද? ක්‍රිෂ්ණාගේ පිංතූරයක් නිවසෙහි ඇති බැවින්, මිනිසුන් දේවාල වලට යන්නේ කුමකටද කියා උගත් මිනිසුන් අසන්නේ මේ නිසයි. ඔබ කොහෙ සිටියත් ක්‍රිෂ්ණාගේ පිංතූරයට වන්දනාමාන කළ හැක. අව්වා, ඔබට පිංතූරයක් නොතිබෙන්නට පුළුවන්, එහෙත් ඔබට ඔහු සිහිපත් කළ හැක. ඔබ යම්කිසි දෙයක් එක් වරක් දුටු විට, ඔබ එය දිගටම සිහි කරයි. ඔබගෙන්ද එයම අසයි. ඔබට නිවසෙහි සිට ශිව් බාබා සිහිපත් කළ නොහැකිද? මෙය අළුත් දෙයකි. කිසි කෙනෙක් ශිව් බාබාව නොදනී. ඔවුන් ඔහුගේ නම, ස්වරූපය, දේශය හෝ කාල වකවානුව නොදන්නා අතර, නිකම්ම ඔහු සර්ව ව්‍යාප්තයි කියා කියයි. ජීවාත්මයකට උත්තරීතර පරමාත්ම ජීවය යැයි කිව නොහැක. ජීවාත්මයන්ට ඔවුන්ගේ පරමාත්ම පියාව සිහිපත් වන නමුත්, ඔවුන් ඔහුව නොදන්නා බැවින්, ඔබ දින හතක් ඔවුන්ට විස්තර කර දිය යුතුයි. ඉන්පසු, විස්තරාත්මක කරුණු සියල්ලද විස්තර කර දෙනු ලබයි. පරම පියා ඥානයේ සාගරයයි. ඔබ මේ තරම් කාලයක් ඔහුට සවන් දෙමින් සිටියේ ඔහු තුළ ඥානය ඇති

නිසයි. ඔබට ඥානය ලැබෙන්නේ මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට පත්වීමට බව ඔබට වැටහෙයි. පරම පියා පවසන්නේ මම ඔබට දිනපතාම අළුත්, ගැඹුරු දේවල් කියන්නෙමි. ඔබට මුරලි නොලැබෙන විට ඔබ බොහෝ සේ හඬා වැටෙයි! පරමාත්ම පියා පවසන්නේ නිකම්ම පරමාත්ම පියා සිහිපත් කරන්න! ඔබ මුරලිය පාඩම් කළද, ඔබට ඒත් පරම පියාව අමතක වෙයි. පළමුව ඔබ සිහි කළ යුත්තේ මම ජීවාත්මයක්මි, ඉතාම කුඩා තිතක්මි. ජීවාත්මයක් යනු කුමක්දැයි ඔබ වටහා ගත යුතුයි. ඔවුන් කියන්නේ ජීවාත්මයක් එම කෙනාගෙන් පිට වී, තව කෙනෙක් තුළට ඇතුළු වීය. ජීවාත්මයන් වන අපි, පුනරුත්පත්ති ගැනීමෙන් අපවිත්‍ර වන්නෙමු. පෙර කළ ඔබ අයත් වූයේ පාරිශුද්ධ ගෘහස්ථ ධර්මයටයි. ලක්ෂ්මි සහ නාරායන යන දෙදෙනාම පාරිශුද්ධ විය. ඉන්පසු දෙදෙනාම අපවිත්‍ර වී, දැන් දෙදෙනාම නැවතත් පාරිශුද්ධ වෙමින් සිටියි. ඉතිං ඔවුන් අපවිත්‍රභාවයෙන් පාරිශුද්ධ වූවාද, නැතහොත් ඔවුන් පාරිශුද්ධ උපතක් ගත්තාද? ඔබ පාරිශුද්ධව සිටි අයුරුත්, ඔබ පාපයේ මාර්ගයට ගොස් අපවිත්‍ර වූ අන්දමත්, පරම පියා මෙතැන අසුන්ගෙන විස්තර කර දෙයි. වන්දනාකරන්නන් අපවිත්‍ර යැයි පැවසෙන අතර, වන්දනාමානයට සුදුස්සන් පාරිශුද්ධ බව කියැවේ. මුළු ලොවෙහිම ඉතිහාසය සහ භූගෝලය ඔබගේ බුද්ධියෙහි ඇත. එහි පාලනය කළේ කවුරුන්ද සහ ඔවුන්ට එම රාජධානිය ලැබුණේ කෙසේදැයි ඔබ දන්නවා. මෙය දන්නා වෙන කිසිවෙකු නොමැත. පෙරකළ, ඔබද නිර්මාණකරු පිළිබඳ ඥානය හෝ, නිර්මාණයේ මුල, මැද සහ අවසානය දැන සිටියේ නැත. එනම්, ඔබ අදේවවාදීන් වීය. ඔබ කිසි දෙයක් දැන සිටියේ නැත. ඔබ අදේවවාදීන් වන විට ඔබ බොහෝ සේ දුක් අත්විදියි. ඔබ දැන් මෙහි පැමිණ ඇත්තේ දේවතාවන් වීමටයි. එහි බොහෝ සතුට තිබෙයි. දිව්‍යමය ගුණධර්ම ධාරණය කළ යුත්තේ මෙහිදීය. ප්‍රජාපිතා බ්‍රහ්මාගේ දරුවන් සහෝදර සහෝදරියන්ය. කිසිම සාපරාදී දෘෂ්ඨියක් නොතිබිය යුතුයි මේ සඳහා උත්සාහය අවශ්‍යයි. දෙඇස ඉතාමත් සාපරාදීයි. පංචේන්ද්‍රයන් සියල්ලන්ගෙන් වැඩියෙන්ම සාපරාදි වන්නේ දෙඇසයි. ඒවා චක්‍රයෙන් භාගයක් සාපරාදීව පවතින අතර, චක්‍රයෙන් භාගයක් ශිෂ්ඨව පවතියි. ස්වර්ණමය යුගයේදී දෙනෙත් සාපරාදී නැත. කෙනෙකුගේ දෙඇස සාපරාදී වන විට ඔහුට රාක්ෂකයෙක් යැයි කියයි. පරම පියාම පවසන්නේ මම අපවිත්‍ර ලෝකයට ඇතුළු වන්නෙමි. අපවිත්‍ර වී ඇති අය පාරිශුද්ධ විය යුතුයි. මෙම කෙනා (බ්‍රහ්ම) තමා දෙවියන් යැයි කියා ගන්නා බව මිනිසුන් කියයි. වෘක්ෂයේ පිංතූරය දෙස බලන්න මෙම කෙනා තමෝප්‍රධාන් ලෝකයේ, වෘක්ෂයේ මුදුනින්ම සිට ගෙන සිටියි. එම කෙනාම වෘක්ෂය යට තපස්යාවේ ද යෙදී සිටියි. ස්වර්ණමය යුගයේදී ලක්ෂ්මි සහ නාරායනගේ පෙළපත දිගින් දිගටම පැවතෙයි. එම කාල වකවානුව ලක්ෂ්මි සහ නාරායනගේ පාලන කාලය ලෙස ගණන් ගැනෙයි. මේ නිසයි බාබා පවසන්නේ ඔබ ලක්ෂ්මි සහ නාරායනගේ රාජධානිය පෙන්වන විට, මෙසේ ලිවිය යුතුයි මෙම රාජධානිය ආරම්භ වී වසර 1250 කට පසුව රිදී යුගය ආරම්භ වෙයි. ග්‍රන්ථ ශාස්ත්‍ර වල වසර සිය දහස් ගණනක් සඳහන් කර ඇත. මෙය දහවල සහ රාත්‍රිය මෙන් වෙනසකි! චක්‍රයෙන් භාගයකට බ්‍රහ්මගේ රාත්‍රිය ඇති අතර චක්‍රයෙන් භාගයකට බ්‍රහ්මගේ දහවල ඇත. මෙම දේවල් විස්තර කරන්නේ පරමාත්ම පියා පමණයි. ඔහු පවසන්නේ සුමිහිරි දරුවනි, තමන් ජීවාත්ම යැයි සළකා පරමාත්ම පියාව සිහිපත් කරන්න! ඔහු සිහිපත් කිරීමෙන් ඔබ පාරිශුද්ධ වී, ඉන්පසු ඔබගේ අවසන් සිතිවිලි ඔබව ඔබගේ ගමනාන්තය කරා රැගෙන යයි. බාබා ඔබට මෙහි නිකම් සිටීමට කියන්නේ නැත. ඔහු සේවය කළ හැකි දරුවන්ට මෙහි ඉන්නට කියා කියන්නේ නැත. මධ්‍යස්ථාන සහ කෞතුකාගාර නොකඩවා විවෘත වෙයි. ආරාධනා පත් බොහෝ දෙනෙකුට දෙනු ලබයි පැමිණ ලෝක රාජධානියට ඔබගේ දිව්‍යමය උත්පත්ති උරුමය හිමි කර ගන්න. ඔබ පරමාත්ම පියාගේ දරුවන්ය. පරමාත්ම පියා දිව්‍ය ලෝකයේ නිර්මාණකරුයි. එබැවින් දිව්‍ය ලෝකයේ උරුමය ඔබට හිමි විය යුතුයි. පරම පියා පවසන්නේ මම දිව්‍ය ලෝකය ස්ථාපනය කිරීමට පැමිණෙන්නේ එක් වරක් පමණයි. එම ලෝක චක්‍රයම නොකඩවා බ්‍රමණය වෙයි. මනුෂ්‍යයින්ගේ උපදෙස් බොහෝමයක් ඇති අතර ඔවුන් නොයෙක් දේවල් කියයි. බොහෝ මත තිබේ. මේවාට කියන්නේ නොබෙදුණු උපදේශ කියායි. වෘක්ෂය ඉතා විශාලයි! අතු රිකිලි බොහෝමයක් මතු වෙයි. ආගම් බොහොමයක් පැතිරෙමින් පවතී. පෙරකළ තිබුණේ එක් උපදේශයක් සහ එක් රාජධානියකි. මුළු ලොව පුරාම පැවතුණේ ඔවුන්ගේ රාජධානියයි. මෙකළ ඔබට මෙය වැටහෙයි. අපි මුළු ලොවෙහිම අධිපතියන්ව සිටියෙමු. ඉන්පසු උපත් 84 ක් ගැනීමෙන් පසු අපි දුප්පතුන් වී ඇත. ඔබ දැන් මරණය ජය ගනිමින් සිටියි. එහි අකල් මරණ නොමැත. මෙහි කෙනෙක් යම් තැනක ඉඳගෙන සිටින අතරෙදී අකල් මරණ සිදුවෙයි. සෑම තැනකම මරණය මිස වෙන දෙයක් නැත. එහි එසේ නොවෙයි. එහි කෙනෙකුගේ සම්පූර්ණ ආයුෂ තෙක් ජීවිතය පවතී. භාරතයේ සාමය, සතුට සහ සමෘද්ධිය පැවතුණි. එහි සාමාන්‍ය ආයුෂ කාලය වසර 150 ක් විය. දැන් ආයුෂ කාලය දෙස බලන්න! පරමාත්ම දෙවියන් ඔබට යෝගා ඉගැන්වීය. එබැවින් ඔබට යෝගේශ්වර් යැයි කියයි. එහිදි ඔබට එසේ නොකියයි. ඔබ මෙකළ යෝගේශ්වර්ය පරමාත්ම දෙවියන් ඔබට රාජ යෝගා උගන්වයි. ඉන්පසු ඔබ රාජ්-රාජේශ්වර් (රජ කුමරුන් සහ කුමරියන්)

බවට පත් වෙයි. ඔබ දැන් ගයානේශ්වර් (ඥානයෙන් සපිරි) ය. ඉන්පසු ඔබ රාජේශ්වර්, එනම් රජුන් ගෙත් රජවරුන් බවට පත් වෙයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබගේ දෙඇස් ශිෂ්ඨ කිරීම සඳහා උත්සාහ දරන්න. ඔබ සහෝදර සහෝදරියන්, ප්‍රජාපිතා බ්‍රහ්මගේ දරුවන් බව, සෑම විටෙකම තම බුද්ධියෙහි තබා ගන්න. එබැවින් ඔබට සාපරාදි දෘෂ්ටියක් නොතිබිය යුතුයි.
2. ඔබගේ ශරීරයේ ජීවිකාව වෙනුවෙන් ක්‍රියාවන් සිදු කරන අතර තුර, ඔබගේ බුද්ධියේ යෝගාව එක් පරමාත්ම පියා වෙතට සම්බන්ධ කරන්න. සියලුම සීමිත දේවල් අතහැර අසීමිත පියා සිහිපත් කරන්න. අසීමිත අත්හරින්නෙකු වන්න.

**වරදානය:** අස්ථාවර අවස්ථාවක් අතරතුර "බාබා" යැයි කියූ සැනින්, ඔබ ස්ථාවර බවට පත්වේ. සිදුවීම ගැන සිතීමට පටන් ගත් විට, ඔබ අපහසුතාවයන් අත්විඳී. හේතුව ගැන සිතීම වෙනුවට, ඔබ විසඳුම ගැන සිතීමට පටන් ගන්නේ නම්, හේතුවම විසඳුම බවට පත්වනු ඇත, මන්ද, මාස්ටර් සර්වබලධාරී බ්‍රාහ්මින්වරුන් ඉදිරියේ, සිදුවීම්, කුහුඹුවන් තරම්වත් නොවන බැවිනි. සිදු වූ දේ හෝ එය සිදු වූයේ ඇයි යන්න ගැන පමණක් සිතීම වෙනුවට, සිදු වූ ඕනෑම දෙයක් යහපතක් ඇති දෙයක් බවත්, එහි සේවය මුසුව තිබූ බවත් සිතන්න. එවිට, එය අහිතකර තත්ත්වයක් ලෙස පෙනුනත්, සේවය එහි මුසු වන අතර, එවිට ඔබ නිරන්තරව නොසැලී සහ නිශ්චලව රැඳී සිටිනු ඇත.

**පාඨය:** **අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

***** ඕම් ශාන්ති *****

කර්මතීත් අවධියට ළඟා වීමට නම්, නිරන්තරයෙන් නොබැඳි නිරීක්ෂකයෙකු ලෙස ක්‍රියා කරන්න. මම අලෞකික ජීවාත්මයක්, නිරන්තරයෙන් නොබැඳි නිරීක්ෂකයෙකුගේ මනෝ ස්ථිතියේ රැඳී සිට සෑම දෙයක්ම කරන අතරතුර නිරන්තරයෙන් නොබැඳි සහ සෙනහසේ මනෝ ස්ථිතියෙන් සිටින්න. මම අලෞකික අත්දැකීම් ඇති, අලෞකික ජීවිතයක් ඇති සහ උසස් ජීවිතයක් ඇති ජීවාත්මයක්මි. නිරන්තරයෙන් මෙම කුල්මත්භාවයෙන් සිටින්න. ක්‍රියා කරන අතරතුර, මෙම පුහුණුව වැඩි කිරීම දිගටම කරගෙන යන්න, එවිට ඔබ කර්මතීත් අවධියට ළඟා වනු ඇත.